ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

පුවත්පත් නිවේදනය

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික සිසුන්ගෙන් (ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයන්, **OCI** කාඩ්පත් හිමියන් සහ අනේවාසික ඉන්දියානුවන් හැර) ස්වයං මූල්‍ය යෝජනා ක්‍රමය යටතේ **2020-21** අධ්‍යයන වර්ෂය සඳහා **MBBS, BDS, BE, B.Tech, B.Pharmacy** සහ **B.Arch** යන උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**2. MBBS / BDS** පාඨමාලා සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන සිසුන් **2020** ජූලි **26** වන දින ජාතික පරීක්ෂණ ඒජන්සිය **(NTA)** විසින් පවත්වනු ලබන **NEET** පරීක්ෂණයෙන් අවම ලකුණු **50** ක් ලබා ගත යුතු වේ. **B.Arch** අපේක්ෂකයින් නවදිල්ලියේ ගෘහ නිර්මාණ කවුන්සිලය විසින් නියම කරන ලද පරීක්ෂණය සමත් වීම අවශ්‍ය වේ.

**3.** උනන්දුවක් දක්වන අපේක්ෂකයින් සතියේ ඕනෑම වැඩ කරන දිනයක පැය **1400-1600** අතර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ අධ්‍යාපන අංශයට තම අ.පො.ස සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සහතික (විභාග දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල විසින් නිකුත් කරනු ලබන) හෝ ලන්ඩන් සාමාන්‍ය හා උසස් පෙළ සහතික සහ උප්පැන්න සහතිකය ඉදිරිපත් කර අයදුම්පත් ලබාගත යුතුය.

**4.** සම්පූර්ණ කරන ලද අයදුම්පත් අවශ්‍ය අනෙකුත් ලේඛන සහිතව භාරදිය යුතු අවසාන දිනය **2020** ජූනි **10** වේ. කෙසේ වෙතත් **NEET** ලකුණු පත්‍රයේ පිටපතක් අපේක්ෂකයාට ලැබුණු වහාම භාර දිය යුතුය.

**කොළඹ**

**2020 මැයි 20**

**ශක වර්ෂ 1942 වෛශාඛ 30**